

**ලාල් හෑගොඩ**

සිංහල චිත්‍රපට කෙෂ්ත්‍රයේ ප්‍රවීන නිශ්චල ඡායාරූප ශිල්පියෙකි. ජ්‍යෙෂ්ට ඡායාරූප ශිල්පයෙන් ඔබ්බට සිය ශාක්‍යතා විහිදුවා ලූ කවියෙකි.

# කලාත්මක ප්‍රයෝග



*ආලෝකය මාධ්‍ය කොට ගනිමින් ඒ ඔස්සේ මවන ප්‍රතිබිම්බයක් තුළින් නිර්මාණයක් බිහිකිරීම ඡායාරූපකරණයේ දළ සැකැස්ම ලෙස අපට කල්පනා කළ හැකිය. මුලින් ම ඡායාරූපයක් බිහි වූයේ වාර්තාමය කටයුත්තක් ලෙසට ය.*

එහෙත් කලක් ගතවීමේ දී නිර්මාණශීලිව යමක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව හා අරමුණ මත ඡායාරූපයකට කලාත්මක අගයක් එක් කිරීමේ ප්‍රවණතාව ඇතිවන්නට විය. මුලින්ම ප්‍රවෘත්තියක් වාර්තාවක් ඉදිරිපත් කිරීමේ ආකාරයට බිහිවූ ඡායාරූපකලාව මංගල ඡායාරූපයක් ආවරණය කිරීම වැනි කලාත්මක අවස්ථාවක් දක්වා වර්ධනය විය.

ලෝකයේ කලාත්මක ඡායාරූප කලාව සඳහා පික්ටෝරියල් ෆොටෝග්‍රැෆි (Pictorial Photography) යන වචනය භාවිත වේ. හුදෙක්ම යුරෝපයේ බොහෝ රටවල මෙම වචනය භාවිත වුවද මෙය දෘෂ්‍යමය ආකල්පයෙන් එපිටට ගිය අරුත් ඇති කලාවක් ලෙස පෙන්වා දිය හැකිය. දෙවියන් වහන්සේ මැවූ දේවලට අමතරව මිනිසුන් විසින් මවන සියලු දේ නිර්මාණ වේ. මිනිස් රසවින්දනය උදෙසා කිනම් මාධ්‍යක් කෙලෙස උපයෝගී කරගත්තත් තෝරාගන්නා ලද මාධ්‍යයට උචිත පරිදි හැඟීම් දනවන ආකාරයට එය ඉදිරිපත් කළ යුතුය. අප කවර ආකාරයක සංසිද්ධියක් ප්‍රකාශ කිරීමේ දී වුවත් ඒ සඳහා අවශ්‍ය මාධ්‍ය කුමක් ද යන්න තෝරා ගැනීම ශිල්පියාගේ කුසලතාව මත සිදුවනවා සේම ඒ සඳහා කිසියම් ආකෘතියක් තිබිය යුතුය. අප කිසියම් වස්තු වූ දෙයක් නාට්‍යමය ආකාරයෙන් ඉදිරිපත් කරන්නේ නම් එහි නාට්‍යමය ගුණයක් තිබෙන්නා සේම කාව්‍යයක් කෙටිකතාවක් ඉදිරිපත් කිරීමේ දී ආකෘතිය හා වචන පද්ධතියෙන් ඔබ්බට ගිය රසයක් කලාත්මක බවක් තිබිය යුතුය. කලාත්මක ඡායාරූපකරණයේ දී ඒ සඳහා සුවිශේෂී වූ රසවත් බවක් ඡායාරූපය තුළ ගැබ්ව තිබීම එහි ඇති ප්‍රධාන ගති ලක්ෂණ වේ. කලාත්මක ඡායාරූපකරණයේ දී ඒ සඳහා යොදා ගන්නා වචනය වන්නේ සැකැස්ම යන අර්ථය ගැබ් වූ "Compossion" යන වචනයයි.

ඡායාරූපයක් බොහෝ විට ද්විමාන වේ. සැබෑ ලෝකයේ සැමවිටම දිග, පළල, ගැඹුර ආදියෙන් පෙනෙන ත්‍රිමාණගති ලක්ෂණවලින් යුතු වෙයි. රේල් පීලි දෙකක් ඈතට දිවෙන විට ඉතා ඈතින් ළංවී ඇති බව පෙනේ. කිසියම් ජීවියකු දර්ශන පථයෙන් වඩාත් ඈතට යන විට ඉතා කුඩාවට පෙනේ. යථා දර්ශනය හා පර්යාලෝකය මෙහි දී වඩාත් අවධානයට යොමු කළ යුතුයි. කෙෂ්ත්‍ර ගැඹුර (Depth of Field) ආදිය ද ශිල්පීමය වශයෙන් අපගේ සැලකිල්ලට භාජනය විය යුතු කරුණක් වනු ඇත. කලාත්මක ඡායාරූපයේ ගුණාත්මක බව වඩාත් ඉස්මතු වන්නේ ඡායාරූපයේ සොඳුරු බව වැඩි කිරීමට ශිල්පියා තුළ ඇති යම් යම් කලාත්මක ප්‍රයෝග තුළින් ඒවා උද්දීපනය කිරීම මඟින් ය. මිනිස් හැඟීම් දනවන හදවතට කතා කරන සේයාරුවක් බිහිකිරීමට ඔහු තුළ ඇති ශිල්පීය දක්ෂතා මහෝපකාරී වේ. කැමරාවේ නාභිගත දුර ප්‍රමාණය අනුව ඡායාරූපයේ දුර ළඟ භාවය තීරණය කළ හැකි වේ. කැමරාවේ ප්‍රධාන අංගය වන ලෙන්සය (Lence) භාවිත කරමින් අපට යම් යම් දේ කළ හැකිය.

උදාහරණයක් ලෙස ගතහොත් කාන්තාවන් ගේ ඡායාරූපයක් කැමරාවට හසුකර ගන්නා විට එහි යම් යම් භාවමය ප්‍රකාශනයක් ප්‍රකාශ කිරීමට ශිල්පියාට අවශ්‍ය වූ විට චිත්‍රය මඳක් බොඳ කිරීමට අවශය වූවා යයි සිතමු.එවිට කැමරාව ස්වල්පයක් සෙලවීමෙන් චිත්‍රය මඳක් බොඳ වී පෙනෙයි. පැදුරක් වැනි යමක පැහැදිලි බව මඳක් අඩු කිරීමෙන් එහි යම් මෘදු බවක් හැඟවීමට ඡායාරූප ශිල්පියාට අවශ්‍ය පරිදි කළ හැකි කාර්යයක් වේ. මේ අයුරින් ඒවායේ භාවමය හැඟීම් දැනවීම කලාත්මක කැමරා ශිල්පියකු සතු කාර්යයකි.

"පටල" ඡායාරූප ක්‍රමයත් සමඟ නවීන ඩිජිටල් කැමරා අද භාවිතයට පැමිණ ඇත. විවිධ වූ පහසුකම් සහිතව කාලය හා ශ්‍රමය ඉතිරිවන පරිදි මේවායින් ද ඡායාරූපකරණයේ විශේෂිත යම් දේ කළ හැකිය. ඩිජිටල් කැමරා විශාල වශයෙන් ජනප්‍රිය වූයේ ආධුනික ශිල්පීන් අතරය. එසේ වූවත් පටල කැමරා ආශ්‍රයෙන් ඡායාරූපකරණයේ යෙදෙන බොහෝ දෙනකු තවමත් ඒ සඳහා පූර්ණ වශයෙන් යොමු වී නොමැති බව පෙනේ. ඩිජිටල් කැමරාවල පහසුකම් වැඩි වශයෙන් තිබුණත්, ඒ සඳහා විශාල ප්‍රාග්ධනයක් දැරීමට සිදුවීම මෙයට මූලික වශයෙන් බලපා ඇතැයි සිතේ.

කෙසේ වූවද කැමරාවක සටහන් වන ඉරි පැල්ලම් ආදියෙන් නිර්මාණය වන සියලු දේ කලාත්මක නිර්මාණ ලෙස සටහන් කිරීම වරදක් නොවේ. සමාජ වගකීමකින් හා මනා සංයමයකින් යුතුව ඡායාරූප ශිල්පීය කාර්යය ඉටු කිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට හැකියාව තිබේ. චිත්‍ර ශිල්පියකු විසින් තම නිර්මාණය තුළ අඳින සෑම පින්සල් පහරක් ම තම අභිමතය හා කුසලතාව මත කෙරෙන්නා සේ ම කෙටි කතාවක, කවියක සියලු ම වචන පෙළගැසීම ලේඛකයා සතුය. එලෙස ම කැමරා ශිල්පියකු ගේ පරිකල්පනය හා සැකැස්ම ඔහු ගේ ස්වයං අභිමතය පරිදි ලෝකයට ඉදිරිපත් කළ හැකි ය.

සටහන

**නන්දි අලුත්ගේ රත්නවීර**